මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2019

13 ශ්‍රේණිය කාලය පැය 02

# නර්තනය ( දේශීය )
# I පත්‍රය

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලකුණු 100 කි.

ප්‍රශ්න අංක 1 -25 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හෝ වඩාත්ම ගැලපෙන පිළිතුරට හිමි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න 2* 50

(1) “උඩරට තාල ශාස්ත්‍රය” සහා “හෙළ ගී මග” කෘති රචනා කරන ලද්දේ ,

(1) මුදියන්සේ දිසානායක සහා සරත් විජේවර්ධනය.
(2) මුදියන්සේ දිසානායක සහා වින්ස්ටන් සෝමපාල.
(3) ජේ.ඊ.සේදරමන් සහ ඩබ්ලිව්.බී.මකුළොලුව ය.
(4) ජේ.ඊ.සේදරමන් සහා තිස්ස කාරියවසම්ය.
(5) ජේ.ඊ.ගුණසේන සහ කේ.ඇස් .ප්‍රනාන්දු (..................)

(2) උඩරට පහතරට සහා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ඇඳුම් වල කොටස් අනුපිළිවෙලෙන් ,

(1) අවුල් හැරය,වාහළ හැට්ටය සහ සඟල ලණුවයි.
(2) අවුල් හැරය,තෙල්මේ හැට්ටය සහ පබලු හැට්ටයයි.
(3) අවුල් හැරය,තෙල්මේ හැට්ටය සහ බුබුලු පට්ටියයි.
(4) පායිම්පත,ඉන හැඩය සහ උල් උඩයයි.
(5) පායිම්පත,දෙවල්ල සහ පබලු හැට්ටයයි. (...................)

(3) කොහොඹා කංකාරියේ ගායනය සහිත ප්‍රධාන නර්තනාංග ලෙස සැලකෙන්නේ,

(1) යක්කුන් පදය,යක් ඇනුම සහ ආවැන්දුමය.
(2) යක්කුන් පදය,යක් ඇනුම සහ කෝල්පාඩුව.
(3) අස්නේ, යක් ඇනුම සහ දුනුමාලප්පුව.
(4) අස්නේ,කොහොඹා හැල්ල සහ මඩුපුරය.
(5) අස්නේ,කොහොඹා හැල්ල සහ ගබඩා කොල්ලය. (...................)

(4) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලයට අයත් කොටස් වන්නේ,

(1) හේලය,පබලු හැට්ටය සහ කරතැල්ලයි.
(2) හේලය,පබලු හැට්ටය සහ දෙවුරමාලයයි.
(3) හේලය,බුබුලු හැට්ටය සහ කයිමෙත්තයි.
(4) රතු රෙද්ද,රතු හැට්ටය සහ වෙස් තට්ටුවයි.
(5) රතු රෙද්ද,රතු හැට්ටය සහ උල් උඩයයි. (...................)

www.artsapi.lk

(5)දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරුන් ලෙස සැලකෙන්නේ,

(1) පත්තිනි,දෙවොල් සහ වාහළ දෙවිරුවන්ය.
(2) පත්තිනි,ගම්භාර සහා කොහොඹා දෙවිරුවන්ය.
(3) පත්තිනි,දෙවොල් සහ කොහොඹා දෙවිරුවන්ය.
(4) දෙවොල්,කතරගම සහ වීරමුණ්ඩ දෙවිරුවන්ය.
(5) දෙවොල්, වාහළ සහ වීරමුණ්ඩ දෙවිරුවන්ය. (....................)

(6) දේශිය තාල පද්ධතියෙහි මාත්‍රා තුනේ ගති ලක්ෂණයට සමාන වන කර්ණාටක තාල පද්ධතිය වන්නේ,

(1) සංකීර්ණ ජාති වේ.
(2) චණ්ඩ ජාති වේ.
(3) චණ්ඩ චාපු වේ.
(4) මිශ්‍ර චාපු වේ.
(5) තිශ්‍ර චාපු වේ. (....................)

(7) දේවාල වල තේවාව සඳහා නියම වූ කුල වලින් පැමිණි කල ගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනන් පිළිබඳ සඳහන් වන්නේ.

(1) සිංහල නර්තන කලාව ග්‍රන්තයේය.
(2) එදා හෙළදිව ග්‍රන්තයේය.
(3) සිංහල ගැමි නාටක ග්‍රන්තයේය.
(4) පරවි සංදේශයේය.
(5) සැළලිහිණි සංදේශයේය. (....................)

(8) 2005 වර්ෂයේදී සෙන්දර්ාය අධ්‍යයන ආයතනය ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පරිවර්තනය වූයේ,

(1) කැළණිය විශ්ව විද්‍යාලය නමිනි.
(2) කොළඹ විශ්ව විද්‍යාලය නමිනි.
(3) සෙන්දර්ාය විශ්ව විද්‍යාලය නමිනි.
(4) සෙන්දර්ාය කලා විශ්ව විද්‍යාලය නමිනි.
(5) සෙන්දර්ාය අධ්‍යන විශ්ව විද්‍යාලය නමිනි. (....................)

(9) “සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝ මුල විදුරාසන” මෙහි,

(1) සදැස්මත් 18,ලඝු මාත්‍රා 12,ගුරු මාත්‍රා 04 කි.
(2) සදැස්මත් 18,ලඝු මාත්‍රා 14, ගුරු මාත්‍රා 04 කි.
(3) සදැස්මත් 20, ලඝු මාත්‍රා 14, ගුරු මාත්‍රා 03 කි.
(4) සදැස්මත් 20, ලඝු මාත්‍රා 16,ගුරු මාත්‍රා 03 කි.
(5) සදැස්මත් 20, ලඝු මාත්‍රා 18, ගුරු මාත්‍රා 03 කි. (....................)

(10) හත් අඩියේ කවි දැකිය හැක්කේ,

(1) කොහාඹාකංකාරියේදීය.
(2) දෙවොල් මඩුවේදීය.
(3) සූනියමේදීය.
(4) පහන් මඩුවේදීය.
(5) රට යකුමේදීය. (....................)

www.artsapi.lk

(11) තෙල්මේ නැටීම සහ වාහල නැටීම නම් විශේෂ නර්තන අංග දෙක දැකිය හැක්කේ,

(1) උඩරට ගම් මඩුවේදීය.
(2) සබරගමු ගම් මඩුවේදීය.
(3) සබරගමු පහන් මඩුවේදීය.
(4) සබරගමු දෙවොල් මඩුවේදීය.
(5) පහතරට දෙවොල් මඩුවේදීය. (..........................)

(12)" ජිං කඩතක ජිං තුකු තක / ගදිත ගතම් දොමි ගදිතම්/ජිං කිටිතත් තත් කිටි කිටිතක" මෙය,

(1) මාත්‍රා 4+4 තනිතිත ය.
(2) මාත්‍රා 2+4 දෙතිත ය.
(3) මාත්‍රා 2+3 දෙතිත ය.
(4) මාත්‍රා 3+3 තනිතිත ය.
(5) මාත්‍රා 2+4+4 තුන්තිත ය. (...................)

(13) ප්‍රාසාංගික වේදිකාවක කණ්ඩායම් නර්තනයක් නිර්මාණය කිරීමේදී වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(1) පුද්ගල හා පොදු අවකාශයට රංග වස්ත්‍රාභරණ සැළසුම් කිරීම ගැනය.
(2) පුද්ගල හා පොදු අවකාශයට රංග වින්‍යාසය සැළසුම් කිරීම ගැනය.
(3) පුද්ගල අවකාශයට ඇඳුම් පැළඳුම් සකස් කිරීම ගැනය.
(4) පුද්ගල හා පොදු අවකාශයට පසුතල නිර්මාණය සැළසුම් කිරීම ගැනය.
(5) පොදු අවකාශයට රංග භාණ්ඩ සැළසුම් කිරීම ගැනය. (...................)

(14) භරත නාට්‍යයම් සහ මණිපුරි නර්තන සම්ප්‍රදායන් සඳහා ඉනට පළඳිනු ලබන රංග වස්ත්‍රාභරණ ලෙස සැළකෙන්නේ,

(1) උච්ච පට්ටම් සහා රිෂම් පුරිට් ය.
(2) ඔට්ටියානම් සහා තොක්කුම්බ් .ය
(3) ඔට්ටියානම් සහා පොෂ්වාන් ය.
(4) රිෂම් පුරිට් සහා පොෂ්වාන් ය.
(5) උච්ච පට්ටම් සහා පොෂ්වාන් ය. (...................)

(15) සමාජීය වශයෙන් ඉපැරණි සන්නිවේදන අවස්ථා ලෙස සැළකෙන්නේ,

(1) රණ බෙර, මඟුල් බෙර සහ පූජා බෙරය.
(2) රණ බෙර, මඟුල් බෙර සහ යහන් බෙරය.
(3) රණ බෙර, හේවිසි බෙර සහ පින් බෙරය.
(4) රණ බෙර, අණ බෙර සහ මළ බෙරය.
(5) රණ බෙර, හේවිසි බෙර සහ පෝය හේවිසි බෙරය. (...................)

(16) රිරි යකා ,කලු යකා සහා සූනියම් යක්ෂණිය චරිත රංගනයේ දී ඇදුම් පැළඳුම් වල වර්ණ භාවිතය කෙරෙන්නේ,

(1) රතු,නිල් සහ කලු ය.
(2) කලු,රතු සහ කහ ය.
(3) රතු,කලු සහ සුදු ය.
(4) කලු,රතු සහ සුදු ය.
(5) රතු,නිල් සහ සුදු ය. (.....................)

www.artsapi.lk

(17) ශාප් මෝචන් සහ චිත්‍රාංගද ,යන භාරතීය නෘත්‍ය නාටක නිර්මාණය කරන ලද්දේ,

(1) උදය ශංකර් විසිනි.
(2) රුක්මණී දේවි අරුන්ඩේල්.
(3) රාම් ගෝපාල් විසිනි.
(4) රවීන්ද්‍ර නාත් තාගෝර් විසිනි.
(5) ශ්‍රීමති මේනකා විසිනි. (....................)

(18) දමිළ සංස්කෘතිය හා බැඳි ගැමි නර්තන වලට අයත් වන්නේ ,

(1) උලවර් නඩනම්,කාවඩි සහ නාගස්වරම් ය.
(2) කෝලාට්ටම්,කුම්මි ,වෙම්පු සහ සුලකූ ය.
(3) කෝලාට්ටම්,කුම්මි ,වෙම්පු සහ කුලු ය.
(4) කෝලාට්ටම්,පින්නල් කෝලාට්ටම් සහ වෙම්පු ය.
(5) පින්නල් කෝලාට්ටම්. වෙම්පු ලී කෙළි සහ ගොයම් ය. (....................)

(19) දේශිය නර්තනයට ඍජුවම සම්බන්ධ වන අවනද්ධ භාණ්ඩ ලෙස සැළකෙන්නේ,

(1) ගැටබෙරය,තම්මැට්ටම,දවුල සහ දඬු බෙරය යි.
(2) ගැටබෙරය,දෙවොල් බෙරය, දවුල සහ දඬු බෙරය යි.
(3) ගැටබෙරය,පහතරට බෙරය, දවුල සහ උඩැක්කිය යි.
(4)ගැටබෙරය,උඩරට බෙරය, දවුල සහ තම්මැට්ටම යි.
(5) උඩරට බෙරය, පහතරට බෙරය, තම්මැට්ටම සහ දඬු බෙරය යි. (....................)

(20) දළදා මාළිගා පෙරහැරේ සිව් මහා දේවාල පෙරහැර අතුරින් ,කාන්තා නියෝජනය විශ්ෂයෙන් දැකිය හැක්කේ,

(1) කුඹල් පෙරහැරේදී ය.
(2) නාථ දේවාල පෙරහැරේදී ය.
(3) විශ්නුදේවාල පෙරහැරේදී ය.
(4) කතරගම දේවාල පෙරහැරේදී ය.
(5) පත්තිනි දේවාල පෙරහැරේදී ය. (....................)

(21) සබරගමු නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්ම වලට පමණක් ආවේණික වූ නාට්‍ය අවස්ථා ලෙස සිදු කෙරෙන්නේ,

(1) රාමා මැරීම,මරා ඉපැද්දීම සහ අසුර යක්කමයි.
(2) රාමා මැරීම, පාළඟ මැරීම සහ මරා ඉපැද්දීම යි.
(3) අසුර යක්කම, පොත් කඩේ යක්කම සහ අයිලෙ යක්කම යි.
(4) අසුර යක්කම, පොත් කඩේ යක්කම සහ රාමා යක්කම යි.
(5) අසුර යක්කම, වනේ යක්කම සහ රාමා යක්කම යි. (....................)

(22) “අක්කා ඉතින් නාඩන්නේ - එක්ව ගොසින් අපි එන්නේ” මෙහි,

(1) ලඝු මත් 08 ක්,ගුරු මත් 08 ක් සහා සදැස්මත් 20 ක්වේ.
(2) ලඝු මත් 07 ක්,ගුරු මත් 08 ක් සහා සදැස්මත් 20 ක්වේ.
(3) ලඝු මත් 06 ක්,ගුරු මත් 10 ක් සහා සදැස්මත් 24 ක්වේ.
(4) ලඝු මත් 05 ක්,ගුරු මත් 10 ක් සහා සදැස්මත් 24 ක්වේ.
(5) ලඝු මත් 05 ක්,ගුරු මත් 10 ක් සහා සදැස්මත් 25 ක්වේ. (....................)

www.artsapi.lk

(23) ඇරිස්ටෝටල් සහ ප්ලේටෝ රසභාව පිළිබඳ අදහස් දැක්වූ අපරදිග මතධාරීන් වන අතර පෙරදිග මතධාරීන් ලෙස හඳුන්වන්නේ,

(1) අභිනව ගුප්ත සහා සොක්‍රටීස් ය.
(2) අභිනව ගුප්ත සහා නන්දිකේෂ්වර ය.
(3) නන්දිකේෂ්වර සහා වල්ලතෝල් නාරායන් මෙනන් ය.
(4) භරතමුණි සහ බාලරාමවර්මා ය.
(5) භරතමුණි සහ නන්දිකේෂ්වර ය. (......................)

(24) බ්‍රිර්ජු මහාරාජ් සහ අච්ඡන් මහා රාජ් නර්තන ගුරුවරුන් ලෙස ප්‍රචලිත වන්නේ,

(1) කථක් නර්තන සම්ප්‍රදායට ය.
(2) භාරත නර්තන සම්ප්‍රදායට ය.
(3) කථකලි නර්තන සම්ප්‍රදායට ය.
(4) මනිපුරි නර්තන සම්ප්‍රදායට ය.
(5) කුච්චිපුඩි නර්තන සම්ප්‍රදායට ය. (......................)

(25) එරන්දති වර්ණනාව,රන්තෙලඹුවේ කවි සහ අටමගලේ කවි යොදා නිර්මාණය කර ඇති ගැමි නැටුම් ලෙස සැළකෙන්නේ,

(1) පන්නෙලීමේ නැටුම.තාලම් නැටුම සහා මෝල් ගස් නැටුම ය.
(2) පන්නෙලීමේ නැටුම,කුලු නැටුම සහා මෝල් ගස් නැටුම ය.
(3) ගොයම් නැටුම කුලු, කුලු නැටුම සහා නැටුම මෝල් ගස් නැටුම ය.
(4) ගොයම් නැටුම කුලු නැටුම සහා පන්නෙලීමේ නැටුම ය.
(5) තාලම් නැටුම කුලු නැටුම සහා පන්නෙලීමේ නැටුම ය. (......................)

26 සිට 50 දක්වා හිස්තැන් පුරවන්න.

(26) “කිරි මැස්ස” ............................................ ශාන්ති කර්මයේ දක්නට ලැබෙන සැරසිල්ලකි.

(27) උඩැක්කිය.......................................... යන නමින්ද හඳුන්වනු ලැබේ.

(28) “අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ” මෙය .......................................... කවියකට අයත් වේ.

(29) .......................................... රසය ජුගුප්සා භාවය මුල් කරගෙන උද්දීපනය වේ.

(30) යක්ෂ,දේව සහා .......................................... සංකල්ප මූලික කරගෙන ශාන්තිකර්ම පවත්වනු ලබයි.

(31) කවි පදයක හෝ බෙර පදයක ඇති ලඝු ගුරු මාත්‍රා වල එකතුව ..........................................නමින් හැදින්වේ.

(32) දේශීය තාල පද්ධතිය පිළිබඳව උඩරට තාල ශාස්ත්‍රය කෘතිය.......................................... මහාතාවිසින් රචනා කරන ලදි.

www.artsapi.lk

(33) මුරුගන් දෙවියන් කොට ගෙන ........................................ නර්තනය ද්‍රවිඩ ගැමි නැටුම් වලදී නර්තනය කරයි.

(34) රටයකුම ශාන්ති කර්මය පැවැත්වීමේදී බෙන්තර ශෛලියේ දී පූර්ව චාරිත්‍රය ලෙස ........................................ යි.

(35) "ඉන්දු දිසාවට ඉඹුල් විමානෙට" යන කවිය ........................................ කි.

ප්‍රශ්න අංක 36 – 50 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු හිස්තැන් හී ලියන්න.

(36) දොළහ පෙළපාලිය හා පොත් කඩේ යක්කම අයත් ශාන්ති කර්ම දෙක නම් කරන්න.

දොළහ පෙළපාලිය ........................................

පොත් කඩේ යක්කම ........................................

(37) තිත් තාල සහිත හා තාත් තාල රහිත කවි ගායනයේදි හඳුන්වන නාම ලියන්න.

තිත් තාල සහිත ........................................

තිත් තාල රහිත ........................................

(38) හිං හතරේ කවි හා දොළේ උපතේ කවි අන්තර්ගත වන ශාන්තිකර්ම දෙක ලියා දක්වන්න.

හිං හතරේ කවි ........................................

දොළ උපතේ කවි ........................................

(39)" බුදු බාප්පේ උඹටයි මටයි හවුලේ කසාදයක් බඳින්න...." මෙම දෙබස අන්තර්ගත වන පෙළපාලිය හා ශාන්තිකර්මය

පෙළපාලිය ........................................

ශාන්තිකර්මය ........................................

(40) යමකු පිළිබඳව වර්ණනා කිරීමට ප්‍රශස්ති රචනා වී ඇත.රජුන් වර්ණනා කිරීමට රාජ ප්‍රශස්ති රචනා වී ඇති අතර අනෙක් ප්‍රශස්ති වර්ග දෙක ලියන්න.

........................................ ........................................

www.artsapi.lk



A



B

(41) A හා B රූප වලින් දැක්වෙන රූප නම් කරන්න.

..........................................　　　..........................................

(42) A රූපයේ දක්වා ඇති නර්තනය ඇතුලත් ශාන්තිකර්මය හා එහිදී භාවිතා කරන රංග භාණ්ඩය ලියා දක්වන්න.

ශාන්තිකර්මය ..........................................

රංග භාණ්ඩය ලියා ..........................................

(43) කර්ණාටක තාල පද්ධතියේ තාල හා ජාති ගණන ලියා දක්වන්න.

තාල ..........................................

ජාති ..........................................

(44) දේශීය තාල පද්ධතියේදී සුලු තනිතිත අඩ තිත යනුවෙන් හඳුන්වන ලදී.මැදුම් තනිතිත හා මහා තනි තිත හඳුන්වා ඇති නාම දෙක ලියන්න.

මැදුම් තනිතිත ..........................................

මහා තනි තිත ..........................................

(45) පොකුරු බෙරය කොටස් දෙකකින් හඳුන්වනු ලබයි. එම කොටස් දෙකේ නම් ලියන්න.

......................................　　　......................................

(46) බටහිර බැලේ නර්තනයේ දී අඳිනු ලබන සාය හඳුන්වන නම ලියන්න.

අතීතයේදී භාවිත සාය ..........................................

වර්තමානයේදී භාවිත සාය ..........................................

(47) රංග වින්‍යාසයේදී භාවිත චලන වර්ග ප්‍රධාන කොටස් දෙකකට බෙදා ලියා දක්වන්න.

ගමන් කරන චලන . ..........................................

ස්ථානගත චලන ..........................................

www.artsapi.lk

(48)



A



B



C

B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රධාය එහි ප්‍රධාන සුෂිර වාද්‍ය භාණ්ඩය ලියා දක්වන්න.

නර්තන සම්ප්‍රධාය .........................................

වාද්‍ය භාණ්ඩය .........................................

(49) C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ ප්‍රභවයට හේතු වූ නෘත්‍ය නාටක දෙක ලියන්න.

.........................................

.........................................

(50) වලියක් මංගල්‍යය පවත්වන ස්ථානය හා එයට ආවේණික වූ සැරසිල්ලක් ලියා දක්වන්න.

ස්ථානය .........................................

සැරසිල්ල .........................................

www.artsapi.lk

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2019

13 ශ්‍රේණිය කාලය පැය 03

# නර්තනය
## II කොටස

- පළමු කොටසේ ප්‍රශ්න අංක 1 හා 2 අනිවාර්ය වේ.
- II හා III යන කොටස් වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වනසේ ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- සෑම ප්‍රශ්නයකම I ල.06 II ල.06 III ල.08

## I කොටස

(01) I.අස්නේ /ශුද්ධ මාත්‍රය/මුල් මාත්‍රය නර්තන අංගයට අයත් බෙර පදයක් හා කවි පදයක් ප්‍රස්ථාර කරන්න.

II.පහත සඳහන් කවි පද දෙක අදාළ තිත් රූපයෙන් අවග්‍රහයට ප්‍රස්තාර කරන්න.
"ඉන්දු දිසාවට ඉඹුල් විමානෙට - හිරු දෙවි අධිපති වන්නේ"

III.තුන් තිතේ තාල රූපයට අයත් වන්නමක /සිංදු වන්නමක කස්තිරම/ඉරට්ටිය/කලාසම ප්‍රස්ථාර කරන්න.

(02) දේශීය නර්තන කලාවේ තොරතුරු පිරික්සීමේදීඓතිහාසික යුග වලින් ලැබෙන සාධක වැදගත් වේ.

I.ගම්පළ යුගයේ දී නර්තන කලාවට භාරතීය ආභාෂය ලැබී ඇති ආකාරය සාධක 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

II.මහනුවර යුගයේ දී නර්තන කලාවට කාන්තා දායකත්වය ලැබුණු බව සාධක ඇසුරින් සනාථ කරන්න.

III.80 දශකයෙන් පසුව නර්තන කලාවේ සමාජීය වශයෙන් සිදු වූ වෙනස්කම් පිළිබඳව විමසීමක් කරන්න.

## II කොටස

(03) දේශිය නර්තන කලාවන් ත්‍රිත්වයේම යක්ෂ,දේව,ග්‍රහ යන යන සංකල්ප මූලික කර ගෙන එක් එක් සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ සහිතව ශාන්ති කර්ම ඉදිරිපත් කරයි.

I.දළදා පෙරහැර අවසානයේ වස් දොස් නිවාරණය සඳහා පවත්වනු ලබන ශාන්තිකර්මයක් ගෙන එම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පිරික්සන්න.

II.කාන්තාවන්ට පමණක් පවත්වනු ලපන ශාන්තිකර්මයක් ගෙන එහි අන්තර්ගත නාට්‍යයමය පෙළ පාලියකින් විද්‍යමාන වන ශිල්පීය කුසලතා පිළිබඳ විමසන්න.

III.කිරිමඩුව ශාන්තිකර්මයෙන් හෙළි වන සමාජ සාරධර්ම හා සම්බන්ධතා උදාහරණ සහිතව විමසන්න.

www.artsapi.lk

**(04)** දේශීය ශාන්ති කර්මයන්ගේ පුරාවෘත කතා නර්තන අංග හා නාට්‍යමය පෙළපාළි වලට හේතු වන අතර එම ශාන්ති තකර්ම වල සුවිශේෂ වූ රංග සැරසිලිද අන්තර්ගත වේ.

**I.**ශාන්තිකර්මයක උපත් කතාවක් ගෙන එහි අන්තර්ගත බෙද්ධාගමික ලක්ෂණ විමසන්න.

**II.**සන්නි යකුම ශාන්තිකර්මයේ යක්ෂ චරිතයක් ගෙන එයින් උද්දීපනය වන රසභාව පිළිබද උදාහරන සහිතව විමසන්න.

**III.**අනෙකුත් ශාන්තිකර්ම වලට වඩා බලි ශාන්තිකර්මයේ සුවිශේෂී සැරසිලි විධි දක්නට ලැබේ විමසන්න.

**(05)** ගැමි නැටුම් හී ඊට ආවේණික ලක්ෂණ මෙන්ම ඒ හා බදි ගායනා වලින් ඔවුන්ගේ ජීවන රටාව විද්‍යාමාන කරයි.

**I.**ගැමි නැටුම් හී ආවේණික ලක්ෂණ හතරක් ලියා එක් ලක්ෂණයක් ගැමි නැටුමක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

**II.**දේශිය ගැමි නැටුමක පසුබිම විමසන්න.

**III.**දේශීය හා ද්‍රවිඩ ගැමි නැටුම්හී සමාන අසමානතා සංසන්ධනය කරන්න.

## III කොටස

**(06)**

| A | B | C |
|---|---|---|
| පොෂ්වාන් | පුංග් - පෙනා | කරදිය |
| ලෙනහගා | නටුවාංගම් - මෘදංගය | බැරිසිල් |
| ඔට්ටියානම් | වෙන්ධා - මද්දලය | කල්පනා |
| තූසැදු | පියානෝව - වයලිනය | හංසවිල |

**I. A** කොටසේ දැක්වෙන දක්ෂිණ භාරතීය නර්තන සම්ප්‍රදායට අයත් රංග වස්ත්‍රාභරණ කොටස නම් කර එම නර්තන සම්ප්‍රදායේ ආගමික පසුබිම පැහැදිලි කරන්න.

**II.B** කොටසේ දැක්වෙන කටකලි නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ නම් කර එම වාද්‍ය භාණ්ඩ වල ව්‍යුහයහා විශේෂතා විමසන්න.

**III.C** කොටසේ දැක්වෙන ලෝක ප්‍රකට බැලේ නාටකය නම් කර එය ලෝක ප්‍රකට වීමට හේතු වූ කරුණුපැහැදිලි කරන්න.

**(07)**නව නර්තන කලාවේ ප්‍රවනතා දේශීය සම්ප්‍රදායික නර්තනයේ ප්‍රවර්ධනයට බලපා ඇත.

**I.**දේශීය නර්තනකලාවේ ප්‍රවර්ධනයට නව ප්‍රවනතා හේතු විය.උදාහරණ සහිතව මෙම කියමන සනාථ කරන්න.

www.artsapi.lk

II.දේශීය නර්තන කලාවට පෙරදිග හා අපරදිග ආභාෂය ලැබී ඇති බව උදාසහරණ සහිතව විමසන්න.

III.අද්‍යතන ප්‍රාසාංගික නර්තනය පිළබදව රූපවාහිනි වැඩ සටහන් ඇසුරෙන් විමසීමක් කරන්න.

(08)දේශිය නර්තන කලාව සංගීතය චිත්‍ර කලාව ආදී අනෙකුත් කලාවන් සමගද සහසම්බන්ධ වේ.

I.චිත්‍ර කලාවේ මූලික අංග නර්තන කලාව හා බැදෙන ආකාරය විමසන්න.

II.නර්තන නිර්මාණයක ප්‍රාසාංගික බව ඉස්මතු කිරීමට සංගීතයෙන් ලැබෙන පිටුවහල ඇගයීමක් කරන්න.

III.පැරණි හා නූතන රංගන භූමි අලංකරණය හා බැදි විවිධ ශිල්ප ක්‍රම තුලනාත්මකව පිරික්සන්න.

www.artsapi.lk